# දිනුම



තිසෙව්නි සෙහාරා ද සිල්වා
**3- D**
මහාමායා බාලිකා විදුහල,මහනුවර.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්වදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හොරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක ඇත පිටිසර ගමක් තිබුණා. ඒ ගමේ නම ලංකාගම. ඒ ගමේ පුංචි පවුලක් ජීවත් වුණා. ඒ පවුලේ චමුති සහ වරුණ නමින් ළමුන් දෙදෙනෙකු සිටියා. ඔවුන්ට පාසල් යන්නවත් හැකියාවක් ලැබුණේ නෑ. ඉතා දිළිඳු පවුලක් වන ඔවුන්ට ජීවත් වීමට පවා ඉතා අමාරු තත්වයක් තිබුණේ. ඔවුන් දෙදනා පාසල් ගියේද ඉරුණු ඇඳුම් ඇඳගෙන වගේම සපත්තු පවා තිබුණේ. නෑ. පාසලේ සිටි ළමයින් ඔවුන්ට සිනාසුණා. ඔවුන්ව කොන් කළා.

නමුත් ඔවුන් පැරදුණේ නෑ. මේ දෙදෙනා ඉගෙනීමට ඉතාම දක්ෂයි. උනන්දුවෙන් ඉගෙන

ගෙන මෙම ළමුන් දෙදෙනා ඉදිරියටම ගියා. ගුරුවරු පවා මෙම ළමුන් දෙදෙනාට නොයෙකුත් වෙනස්කම් කළද වාර විභාගවලදී වැඩිම ලකුණු ගැනීමට මෙම ළමුන් දෙදෙනා සමත් වුණා. මෙම පාසලේ සිටි නිමලා නැමැති ගුරුතුමියක් පමණක් මෙම ළමුන් දෙදෙනාට ඉතා ආදරෙන් සැලකුවා. මොවුන් දෙදෙනා ගෙදර ඇවිත් හොඳින් පාඩම් කළ නිසා වාර විභාගයට වැඩිම ලකුණු ලබාගැනීමට හැකිවුණා. ඒ බව ඇසූ ඔවුන්ගේ දෙමව්පියන්ට ලොකු සතුටක් දැනුණා.



මෙම පාසලේ ක්‍රීඩා උත්සවය යෙදී තිබුණේ මැයි මස 15 වනදාට. පුහුණුවීම් පටන් ගත්තද වමුතිට සහ වරුණට ක්‍රීඩා උත්සවයට ඇදිමට ඇඳුම් තිබුණේ නැහැ. නමුත් තිමලා ගුරුතුමිය

ඔවුන්ට ඇඳුම් ගෙනවිත් දුන්නා. ඔන්න ඉතින් ක්‍රිඩා උත්සව දිනය ආවා.

හැමෝගෙම අම්මලා තාත්තලා ක්‍රීඩා උත්සවය බලන්න ආවා. මෙම දරුවන් දෙදෙනාද ක්‍රිඩා උත්සවයට ගුරුතුමී දුන් ඇඳුම් ද ඇඳගෙන උදෙන්ම පාසල් ගියා. හැම ක්‍රිඩාවකින්ම වගේ වරුණ සහ චමුති ජයග්‍රහණය කළා. දෙමව්පියන් මෙන්ම තිමලා ගුරුතුමිය ද බොහෝසේ සතුටු වුණා.

පසුදා පාසල් යද්දි ඔවුන් පුදුමයට පත් කරමින්



වෙනුවෙන් උත්සවයක් සූදානම් කර තිබුණා. ඔවුන්ට හරිම සතුටුයි. ගුරුවරුන්ට වැඳ ආශිර්වාද ලබාගත් මොවුන්ට හැමෝම අත්පොළසන් නගමින් ආශිර්වාද කළා. හැමෝම

ඔවුනගේ යහළුවන් බවට පත්වුණා. ගුරුවරු හැමෝම ඔවුන්ට ආදරය කරන්න පටන් ගත්තා. ඉන්පසු ඔවුන්ට හැමෝම ආදරෙන් සැලකීමට පටන් ගත්තා.

මෙවර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි චමුති වැඩි ලකුණු ගෙන ඉහළම මට්ටමින් සමත්වීම නිසා ඇයට නගරයේ පිහිටි පාසල වෙත යාමට සිදුවිය.

ඉතා දිළිඳු මට්ටිමේ සිටින ඇගේ දෙමව්පියන්ට එය ඉතා අසීරු කරුණක් වුවද කෙසේ හෝ ඇගේ අනාගතය වෙනුවෙන් ඔවුන්

එකී දැඩි අසීරු තත්තවයට මුහුණදීමට තීරණය කලහ. ඇය නගරයේ පාසලට ගොස් ඉතා හොඳින් ඉගෙනීමේ කටයුතු කළා. එම පාසලේ ඇය දීප්තිමත් ශිෂ්‍යාව ද විය.

කාලය කෙමෙන් ගෙවී යද්දී චමූති මෙන්ම ඇගේ මල්ලිද ඉගෙනීමෙන් ඉතා ඉහළ මට්ටමකට ගොස් සිට බව බොහෝ දෙනාට තේරුම් ගන්න වැඩි කාලයක් ගියේ නෑ. ඔවුන්ගේ දෙමව්පියන්ද වෙනදාට වඩා මහන්සියෙන් වැඩ කරමින් ඉගෙනීමේ කටයුතු සඳහා උදව් කළා. ඒ වගේම ගමේ පාසලේ ගුරුවරුන්ද පුළුවන්

අයුරින් ඔවුන්ට උදවු උපකාර කරයි.

චමුතිගේ නගරයේ පාසලේ 6 පන්තියේ සිසුන් 50 පමණ සිටියා. මුල් කාලයේ වාර විභාගය පැවැත් වුණා. එහිදි චමුති පන්තියේ 25 වෙනියා වුණා. කෙසේ හෝ ඇගේ අරමුණ වුණේ ඉහල ට යාමටයි. කෙසේ හෝ 11 වන වසර සාමාන්‍යපෙළ විභාගය ආසන්නයට ආවා.

එහිදි ඇය පන්තියේ මුල් පස්දෙනා අතර තත්වයකට එන්න හැකියාව ලැබුණා. මේ අයුරින් නිසි උද්යෝගයෙන් හා උත්සහයෙන් මහන්සිවෙලා සාමාන්‍යපෙළ විභාගයෙන් ඉහලින්ම සමත් උනා. මේ ආකාරයෙන් උසස්පෙළ විභාගයෙන් ද ඉහළින්ම සමත්ව විශ්ව විද්‍යාලයට වරම් ලබනවා. උපාධිය ලබාගත් චමුති තමන් අවසන් වරට ඉගෙනුම ලැබූ පාසලේම ගුරුවරියක් ලෙස පත්වීම් ලබනවා.



කෙසේ හෝ වමුති අවසානයේ තමාගේ දිළිඳුකම පරදවා ඇයගේ ජීවිතයේ ලද ලොකුම ජයග්‍රහණය කරා ළගාවිය. උත්සාහය තිබේනම් ඕනෑම දෙයක් ජයගත

හැක. ඇගේ දිනුම කරා ඇය ළගාවූයේ දැඩි උත්සාහයෙන් යුතුව ය.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ගුන්ටකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

# Book Details With ISBN

ISBN

9786242086156